අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION
තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.
දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045
වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk

2025.02.15 මාධ්‍ය නිවේදන අංක: 2025/013/R

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
සියලු මාධ්‍ය ආයතන

**<u>රු. 200,000/- ක (රුපියල් ලක්ෂ දෙකක) මුදලක් අල්ලස් වශයෙන් ඉල්ලා ලබාගත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු අල්ලස් චෝදනා මත අත්අඩංගුවට</u>**

ඉබ්බාගමුව ප්‍රදේශයේ පුද්ගලයෙකු විසින් කරන ලද පැමිණිල්ලකට අනුව, පැමිණිලිකරු ඔහුගේ හිතවතුන් කිහිප දෙනෙකු සමඟ එකතු වී පවත්වාගෙන යනු ලබන අවන්හලේ 2025 වර්ෂය සඳහා වෙළෙඳ බලපත්‍රය අලුත් කිරීමට ගලේවෙල ප්‍රාදේශීය සභාව වෙත භාර දී ඇති අයදුම්පත්‍රයට අදාළව, ගලේවෙල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා වෙළඳසැලට පැමිණ පරීක්ෂා කර වෙළෙඳ බලපත්‍රය අලුත් කිරීමට අදාළ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ නිර්දේශය සහිත ලිපිය ප්‍රාදේශීය සභාවට ලබා දීම සඳහා රුපියල් ලක්ෂ දෙකක මුදලක් අල්ලස් වශයෙන් ඉල්ලා, ලබාගත් ගලේවෙල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු 2025.02.14 දින ප.ව.7.48 ට පමණ තල්කිරියාගම, ශ්‍රී බුද්ධි ජයන්ති පන්සල අසල පාරේ දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගන්නා ලදී.

අත්අඩංගුවට ගන්නා ලද සැකකරු දඹුල්ල මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මාධ්‍ය ඒකකය**
0112502672